# ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය

## අයදුම්පත්/නාම යෝජනා සඳහා ආරාධනය

## උපකුලපති තනතුර

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පණතේ 34 වන වගන්තිය ඉන් අනතුරුව සිදුකෙරුණු සංශෝධන සහ 2020 මැයි 04 දින දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ චක්‍රලේඛ අංක 02/2020 හි විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයීය පාලක මණ්ඩලය විසින් රුහුන විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුර සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන් වෙතින් 2021.08.16 දින සිට 2021.09.16 දින දක්වා අයදුම්පත්/නාමයෝජනා සඳහා ආරාධනය කරනු ලැබේ.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පණතේ විධිවිධාන යටතේ උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීණ නිලධරයකුවේ. ඔහු/ඇය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරියා, ප්‍රධාන අධ්‍යයන නිලධාරියා සහ ගණන්දෙන නිලධාරියා වේ. ඔහු/ඇය පාලක සභාව සහ සනාතන සභාව යන දෙකෙහිම නිලබලයෙන් සාමාජිකයෙකු සහ සභාපතිවරයා වේ.

උපකුලපතිවරයා ධූරයෙන් වේලාසනින් ඉවත්වන්නේ නම් හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල සංශෝධන පණත ප්‍රකාරව ධූරයෙන් ඉවත්කරන්නේ නම් හෝ හැර වසර 3 ක කාලසීමාවක් හෝ ඔහු/ඇය හැටපස්වන විය සම්පූර්ණ කරන තෙක් යන අවස්ථා දෙකින් මුලින් එළඹෙන කවර හෝ අවස්ථාව දක්වා ධූරය දරනු ඇත.

උපකුලපතිවරයා කළමනාකරණ ප්‍රතිපත්ති සම්පාදනය කරමින්, ක්‍රියාත්මක කරමින් හා හඳුන්වා දෙමින් සහ පාලක සභාවේ තීරණ ක්‍රියාත්මක කරමින් ශාස්ත්‍රීය නායකත්වය ලබාදීම, විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය සිදුකිරීම සඳහා වගකිවයුතු වන අතර, ඒ අනුව ශාස්ත්‍රීය විශිෂ්ඨත්වය, පාරදෘශ්‍යභාවය, වගවීම, ප්‍රජාතන්ත්‍රීය කළමනාකරණය සහ ඵලදායී අපක්ෂපාතී නායකත්වය යන මූලධර්ම පවත්වාගෙන යා යුතුය

අයදුම්කරු/නම්කරනු ලැබූ අය ශ්‍රී ලාංකීය පුරවැසියන් විය යුතු අතර, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 63 නොවැඩි විය යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරු සතුව ශක්තිමත් පර්යේෂණ පැතිකඩක් ඇතුළුව ඉහළ ශාස්ත්‍රීය කාර්ය සිද්ධියක්, සනාථ කළ නායකත්ව ගුණාංග සහ විවිධාකාර උනන්දුව දක්වන කණ්ඩායම් සමඟ වෛෂයිකව අන්තර්ක්‍රියාකිරීම සඳහා අන්තර් පුද්ගල හැකියාවක්, ප්‍රතිපත්තිමය ගැටළු පිළිබඳ නිවැරදි අවබෝධයක් සහ තීරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කැපවීමක් තිබිය යුතුය. ඔහු/ඇය සතුව විශ්වවිද්‍යාලීය ප්‍රජාව පිළිබඳ කැපවීමක් ඇතුළුව විශ්වවිද්‍යාලයේ ආචාරධර්ම සහ මෙහෙවර පිළිබද ගැඹුරු අවබෝධයක්ද තිබිය යුතුය.

උපකුලපතිවරයාහට ඉහළම අධ්‍යයන වැටුප් පරිමාණයක් ලැබීමට සහ වැටුපෙන් 15% ක සංග්‍රහ දීමනාවක්, නිවාස සහ ප්‍රවාහන පහසුකම්වලට හිමිකම් ඇත.

**අයදුම්පත්/නාම යෝජනා සමග පහත සඳහන් ලිපිලේඛන ඉදිරිපත් කළ යුතුය.**

01. අපේක්ෂිත අයදුම්කරුට/නම්කරනු ලැබූ අයට විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීම සඳහා දැක්ම පිළිබඳ ප්‍රකාශයක්, උපකුලපති ධූරයට පත්කරනු ලැබුවහොත් ඔහු/ඇය සාක්ෂාත් කර ගැනීමට යෝජනා කරන දෙය පිළිබඳ කෙටි විස්තරයක් සහ අයදුම්කරුගේ උපන්දිනය ඇතුළත් සම්පූර්ණ ජීවදත්ත ඉදිරිපත් කරණ ලෙසට දැනුම් දෙනු ලැබේ.

02. දැනට ධූරය දරන උපකුලපතිවරයා අයදුම්කරුවකු වන්නේ නම් හෝ මෙයට පෙර විශ්ව විද්‍යාලයේ උපකුලපති ධූරය දරා ඇත්නම් ඉහත (i) ඡේදයේ සඳහන් කර ඇති ලිපිලේඛනවලට අමතරව ඔහු/ඇය තම පළමු ධූර කාලය තුළ සාක්ෂාත් කරගත් දෑ සඳහන් කරමින් වාර්තාවක් ලබාදිය යුතුය.

03. නාමයෝජනාවක් නම් නම්කරනු ලැබූ අයගේ කැමැත්ත පළකිරීමේ ලිපිය.

04. අයදුම්කරු/නම්කරනු ලැබූ අය රාජ්‍ය සේවයේ, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය හැර වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක සේවය කරන්නේ නම් අයදුම්කරු/නම්කරනු ලැබූ අය තනතුරට පත්කරනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළහැකිද යන වග සඳහන් කරමින් සේවා යෝජකයාගේ ලිපියක්.

අයදුම්පත්/නාමයෝජනා අදාළ ලිපිලේඛන සමග කුලියාපිටිය ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි කාර්යාලය, ලේඛකාධිකාරි පාලක සභාවේ ලේකම් නමට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ 2021.09.15 වන දින ප.ව 3.00 ට හෝ ඉන් පෙර ලේඛකාධිකාරි වෙත ලැබෙන සේ අතින් ගෙනැවිත් භාරදීමට හෝ පුළුවන. අවශ්‍ය කෙරෙන ලිපිලේඛන සහිත අයදුම්පත්/නාමයෝජනා බහාලන ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ "**උපකුලපති තනතුර**" යනුවෙන් සඳහන් කළ යුතුය.

අයදුම්පත්/නාමයෝජනා භාරගන්නා අවසන් දින සිට මාස දෙකක් තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ චක්‍රලේඛ අංක 02/2020 හි නියම කර ඇති උපමාන පරිදි සම්මුඛ පරීක්ෂණයක් සඳහා ඇගයුම් කමිටුව රැස්කරනු ලැබේ. අයදුම්කරුවන් මේ සඳහා පත්කරනු ලබන ඇගයුම් කමිටුව හමුට කැඳවනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ වෙබ් අඩවි සැබැඳිය වන https://www.ugc.ac.lk/en/policy/commission-circulars/176-circulars-pubished-in-2020-012020-and-above/2198-commission-circular-no-022020-appoinment-to-the-post-of-vice-chancellor.html. වෙතින් වැඩි විස්තර ලබාගත හැකිය. සුවිශේෂී තත්වක් තුළ යම් අයදුම්කරුවකුට ඇගයුම් කමිටුව හමුවට පැමිණීමට නොහැකිවන්නේ නම් ඔහුට/ඇයට වීඩියෝ සම්මන්ත්‍රණය (video conferncing) මගින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්වීමට අවසර දෙනු ලැබේ.

ඇගයුම් කමිටු රැස්වීම පවත්වනු ලබන දිනම අයදුම්කරුවන් තිදෙනෙකුගේ නම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම වෙත නිර්දේශ කිරීම සඳහා පාලක සභාවේ විශේෂ රැස්වීමක් කැඳවනු ලැබේ.

ඇගයුම් කමිටුව විසින් කෙටි ලැයිස්තුගත කරනු ලබන සහ පාලක සභාව විසින් අනුමත කරනු ලබන අයදුම්කරුවන් මිනිත්තු දහයකට (10) නොඅඩු සහ පහළොවකට (15) නොවැඩි කෙටි ඉදිරිපත් කිරීමක් සිදුකිරීම සඳහා පාලක සභාවේ විශේෂ රැස්වීමක් හමුවට කැඳවනු ලැබේ. එසේවුවද යම් අයදුම්කරුවකු පාලක සභාවේ සාමාජිකයෙකු වුවද එවැනි අයදුම්කරුවකුට අන් අයදුම්කරුවන්ගේ ඉදිරිපත් කිරීම් සහ ඇගයුම් කිරීම සඳහා සහභාගීවීමට අවසරදෙනු නොලැබේ. සුවිශේෂී තත්වයක් තුළ යම් අයදුම්කරුවකුට පාලක සභාවේ. විශේෂ රැස්වීම හමුවට පැමිණීමට නොහැකිවන්නේ නම් ඔහුට/ඇයට වීඩියෝ සම්මන්ත්‍රණය (video conferncing) මගින් ඉදිරිපත් කිරීමක් සිදුකිරීමට අවසර දෙනු ලැබේ.

අයදුම්කරුවන් තිදෙනෙකුගේ නම් නිර්දේශ කිරීම සඳහා පවත්වනු ලබන පාලක සභාවේ විශේෂ රැස්වීමේ වාර්තාව සකස් කොට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ චක්‍රලේඛ අංක 02/2020 හි නියම කර ඇති සියලු ලිපිලේඛන සමග වැඩිදුර ක්‍රියාමාර්ග සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්/නාමයෝජනා අයදුම්පත් සළකා බලනු නොලැබේ.

**ලේඛකාධිකාරි සහ පාලක සභාවේ ලේකම්,**
**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය.**
**2021.08.10**